කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

පාලි - PALI – E 3025

පාලි පිටකාගත දර්ශනය, ආචාර ධර්ම හා මූලාශ්‍රය අධ්‍යයනය

කොටස් තුනෙන් ම තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. මුල් බුදුසමයෙහි ප්‍රධාන ඉගැන්වීම් අතරෙහි දෘශ්‍යමාන සමතා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

02. සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක ලෝකයට අදාළ බෞද්ධ විභජන විධි හඳුන්වා දී ඒවායේ අභිමතාර්ථයන් කවරේදැයි පරීක්ෂා කරන්න.

03. බෞද්ධ කර්ම සංකල්පයේ පසුබිම හෙළිකොට කර්මය සහ පුනර්භවය අතර ඇති සම්බන්ධය ප්‍රකට කරන්න.

## 11 කොටස

04. බෞද්ධ ගිහිපැවිදි සමාජයට මෛථුන ධර්මය අදාළ වන නොවන අයුරු පෙන්වා දෙන්න.

05. ඝාතනය, මනුෂ්‍ය ඝාතනය සහ ආත්ම ඝාතනය පිළිබඳ ආගමික සහ සාමාජික විවරණ හෙළිදරව් කරන්න.

06. ''වත්තං අපරිපූරෙන්තො න සීලං පරිපූරති'' යන්න චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකය ඇසුරින් සනාථ කරන්න.

අ. පි. බ.

## 111 කොටස

07. තතො පරං සටා'සමා මහාකස්සපත්ථෙරො ඡළභිඤ්ඤා-චතුපටිසම්භිදප්පත්තෙහි ඛීණාසවභික්ඛූහි උච්චිනිත්වා සත්තමාසං පඨමසංගීතිං අකාසි; සටා ව'සමා මහායසත්ථෙරො ඡළභිඤ්ඤා-චතුපටිසම්භිදප්පත්තෙහි සත්තසතමත්තෙහි ඛීණාසවභික්ඛූහි උච්චිනිත්වා අට්ඨමාසං දුතියසංගීතිං අකාසි; එවං ඡළභිඤ්ඤා-චතුපටිසම්භිදප්පත්තෙහි සහස්සමත්තෙහි ඛීණාසවභික්ඛූහි උච්චිනිත්වා නව මාසං තතියසංගීතිං අකාසි. සාසනපතිට්ඨාපනවිධානෙ පන අනාගතෙ සාසනං පච්චන්තරට්ඨෙසු පතිට්ඨහිස්සතීති විදිත්වා "තෙසු තෙසු රට්ඨෙසු සාසනං පතිට්ඨාපෙථා"ති තෙ තෙ මජ්ඣන්තික ථෙරාදයො ථෙරෙ පෙසෙසි.

තෙසු මහාමහින්දත්ථෙරං තම්බපණ්ණිදීපෙ සාසනං පතිට්ඨාපෙතුං පෙසෙසි. සොණත්ථෙරම්පන උත්තරත්ථෙරං ච සුවණ්ණභූමිරට්ඨසඞ්ඛාත රාමඤ්ඤදෙසෙ සාසනං පතිට්ඨාපෙතුං පෙසෙසි. තදා සුවණ්ණභූමිරට්ඨෙ සිරිමාසොකො නාම රාජා රජ්ජං කාරෙති. තස්ස රාජධානිනගරං කෙලාසපබ්බතචෙතියස්ස පච්ඡිමාය දිසාය හොති. තස්ස තු නගරස්ස පාචීනපස්සභාගො පබ්බතමුද්ධනි හොති, පච්ඡිමපස්සභාගො සමෙ භූමිභාගෙ හොති. තං පන නගරං ගොළමත්තිකඝරානං විය මත්තිකඝරානං බහුලතාය ගොළමත්තිකනගරන්ති යාවජ්ජතනා වොහරන්ති. තස්ස පන නගරස්ස සමුද්දූපකණ්ඨතා සමුද්දවාසී රක්ඛසී රාජගෙහෙ අනුජාතං දාරකං සතතං ගහෙත්වා ඛාදති. තස්මිං ච ථෙරාගමනසමයෙ රක්ඛසී රාජගෙහෙ එකං දාරකං විජායි. සා පි රක්ඛසී රාජගෙහෙ දාරකස්ස ජාතභාවං ඤත්වා පඤ්චසතපරිවාරා නගරාභිමුඛී ආගච්ඡති.

අ) ඉහත ඡේදය සිංහලට නඟන්න.

ආ) එය බුරුම, නාගර හෝ රෝමන් අකුරෙන් පිටපත් කරන්න.

ඉ) බුරුම ලංකා දෙරටටම වැදගත් වන ඓතිහාසික කරුණු අනාවරණය කෙරෙන ලේඛනයක් ලෙස කල්‍යාණී සෙල්ලිපිය අගයන්න.

08. අ) මෙම ඡේදය සිංහලට නඟන්න.

ආර්‍යමහාසාංඝිකානාං ලෝකොත්තරවාදීනාං මධ්‍යදෙශිකානාං පාඨෙන විනයපිටකස්‍ය මහාවස්තුයෙ ආදි.

චතුර්විධා උපසංපදා - ස්වාම උපසංපදා එහිභික්ෂුකාය උපසංපදා දශවර්ගේන ගණෙන උපසංපදා පංචවර්ගේන ගණෙන උපසංපදා ච. තත්‍ර ස්වාමුපසංපදා නාම උපසංපන්නා භගවන්තොභ්‍යාසෙ බොධියමූලෙ. දශකුශලා කර්මපථා යෙ හි සමාදාය වර්තන්ති තෙ බොධාය සමාසන්නතරා භවන්ති. තත්‍රාපි ච සො ප්‍රතිවිශිෂ්ටො. තෙමෙ‍ෙනා. බුද්ධවෛනෙයතායෙව. සුකෘතිෂ්වෙතාසු චරිතෙත දීපංකරමූපාගමිය පරිපාටියා ප්‍රාණකොටීෂු දෘෂ්ට්වා දර්ශනීයං සමන්තප්‍රාසාදිකං ප්‍රසාදනීයං ශ්‍රාවකසංඝපරිවෘතං තස්‍ය ස්පෘහාචිත්තමුත්පාදෙය. සාධු ස්‍යාදහදපනං ලොකමෙව අභිභූය ලොකෙ ලොකාර්චවරො ලොකස්‍යාස්‍ය හිතාය ජායෙයං.

ආ) "උපසම්පදා" යන්නෙහි අර්ථ විවරණය කොට විවිධ බෞද්ධ මූලාශ්‍රයයන්හි හමුවන උපසම්පදා ක්‍රම පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.